සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** / தென் மாகாணக் கல்வித் திணைக்களம்

**DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE**

**අවසාන වාර පරීක්ෂණය - 2021 (2022 මාර්තු)**

| 10 ශ්‍රේණිය | සිංහල සාහිත්‍ය රසාස්වාදය - I | කාලය පැය 2 |
|---|---|---|

නම / විභාග අංකය ...............................................................................................................

- පැය තුනයි අමතර කියවීම් කාලය - මිනිත්තු - 10 යි.
- අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.
- මෙම ප්‍රශ්න පත්‍රය අනිවාර්ය ප්‍රශ්න දෙකකින් (02) සමන්විත වේ. එම ප්‍රශ්න දෙක සඳහා ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයා වෙන ම භාර දෙන්න.

1 පත්‍රයෙහි I ප්‍රශ්නයටත් (02) ප්‍රශ්නයෙහි තෝරාගත් ප්‍රශ්න එකකට පමණක් ද පිළිතුරු ලියන්න.

1. **(i)** සිට **(v)** තෙක් ඇති කොටස් කියවා ඒවා ඇසුරින් අසා ඇති (අ) (ආ) ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(ලකුණු 4×5 = 20 යි)

(i) ''පෙර ආසනයේ උන් තැනැත්තෝ ම පළමු කොට ම බටුය''

(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?

.......................................................................................................................

(ආ) එම ප්‍රකාශය ශ්‍රවණය කළේ කවරෙක් ද?

.......................................................................................................................

(ii) ''අපි එන අවුරුද්දේ ඔයිටත් ලොකු කුඩුවක් හදමු''

(අ) මෙම ප්‍රකාශය කළේ කා හටද?

.......................................................................................................................

(ආ) මෙම ප්‍රකාශය කළ තැනැත්තා තුළ ඇති මානුෂික හැඟීම කුමක්ද?

.......................................................................................................................

(iii) ''පුතේ, අම්මට කියහංකො මාම ඇවිත් ඉන්නවයි කියලා''

(අ) මෙම ප්‍රකාශයෙහි මාමා යනු කවරෙක් ද?

.......................................................................................................................

(ආ) මෙම අවස්ථාවේ දී මාමා ඇවිත් ඉන්නේ කුමක් සඳහා ද?

.......................................................................................................................

(iv)
තිරසර ගුණයෙන් යුතු උතුමකු හට — පවර
සමුදුර සියල් කිඳලෙක තුඹසෙක — **සුනෙර**
පුවතර මෙ දඹදිව මළුවෙක සිය — ගෙදොර
ඔහු කර නො වන සැපතෙක් එ බැවින් — කවර

(අ) මෙහි මුල් කවි පද දෙකෙහි අදහස ලියන්නන

.................................................................................................................................................

.................................................................................................................................................

ආ) කද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.

.................................................................................................................................................

(v) ඩහදිය හෙළන අය හිරිහැර අතර වැටී
දකුණේ මෙන්ම උතුරෙත් හැම තැනම සිටී
විමසා බලමි ඔවුනගේ හදවතෙහි හැටී
කළුගල් යකඩ නොව උණු වී හැළෙන ඉටී

(අ) මෙහි මුල් කවි පද දෙකෙන් කියැවෙන අන්‍යාලාපය කුමක්ද?

.................................................................................................................................................

(ආ) කවියා පවසන පරිදි දකුණේ සහ උතුරේ ජන හදවත් ඇති පොදු ලක්ෂණයක් වන්නේ කුමක්ද?

.................................................................................................................................................

2. පහත සඳහන් ගද්‍ය - පද්‍ය කොටස් දෙකින් එක කොටසකට පමණක් උත්තර සපයන්න.

බිසවුන් යහපතැයි ගිවිස කුමාරයන්ට මෙපවත් කිසා අභිප්‍රාය විචාර ගෙන එවයි කියා කම්මිත්තක යවූ හ. ඒ ස්ත්‍රී ගොසින් බෝධිසත්වයන්ට එපවත් කිවූ ය. ඒ අසා මහ බෝසතාණෝ මම රූ නැත්තෙමි. රූපශ්‍රීන් යුක්ත වූ රාජ කුමාරිකාවක් ගෙනෙන ලද නම් මා දක යකකු මෙන් විරූපී වූ මොහුගෙන් මට කම් කිම් දැයි පලා යන්නී ය. ඒ අපට ලජ්ජා කටයුතු වන්නේ ය. එහෙයින් මට ගෘහ වාසයෙන් ප්‍රයෝජන නැත. මාපිය දෙ දෙනා ජීවත් වන තෙක් උපස්ථාන කොට ගුරු දෙදෙනා ඇවෑමෙන් ගොස් මහණ වෙම් ය සිතා මහ බෝධිසත්වයෝ තමන්ගේ මේ අදහස ඒ කම්මිත්තියට කියූ ය. ඕ තොමෝ ගොස් එවෙත් බිසවුන්ට කිව. බිසව් එපවත් රජ්ජුරුවන්ට කීහ. ඒ අසා රජ්ජුරුවෝ නො සතුටු ව නැවත කීප දවසකින් එලෙස ම කියා යවූ ය. බෝධිසත්වයෝ නො කැමැත්තේ යයි තුන් යලක් වළකා සතර වෙනි වාරයෙහි දෙමව්පියන් කීවා නොකොට වරදවා පිළිපැදීම කටයුතු නො වෙයි. ඊට තිසි උපදෙසක් කෙරෙමියි සිතා මහා බෝධිසත්වයෝ තරාල් දෙටුවකු කැඳවා බොහෝ රත්රන් දී එක් ස්ත්‍රී රූපයක් කොට ගෙනෙවයි කියා ඔහු නික්මවා තුමූ රත්රනින් ස්ත්‍රී රූපයක් කළෝ ය.

බෝධිසත්වයන්ගේ අභිප්‍රාය සිතූ පැතූ ලෙස ම සිද්ධ වන බැවින් ඒ රන්රුව කියා නිමවිය නො හැකි රූප ශෝභා ඇත්තේ විය. එකල මහ බෝධිසත්වයෝ ඒ රන් රුව සුරත් කොමු පිළියක් අඳවා ශ්‍රී යහන් ගර්භයෙහි සිටවූහ. ඉක්බිති බෝධිසත්වයෝ තරාල ඇදුරා විසින් ගෙනෙන ලද රන් රුවට නින්දා කොට ''යව, අපගේ ගර්භයෙහි තුබූ ස්වර්ණ, රූපය ගෙනෙවයි''. ස්වර්ණකාරයා හට නියෝග කළේ ය. එසඳ ඒ ගොස් ශ්‍රී යහන් ගර්භයට වැද ඒ රන් රුව දක කුමාරයන් වහන්සේ හා සමග ක්‍රීඩා පිණිස ආ දිව්‍යප්සරාවක් වනැයි සිතා අත දික්කරන්නටත් නො පොහොසත්ව බෝධිසත්වයන් කරා ගොස් ''දේවයන් වහන්ස බිසවුන් වහන්සේ තනිව වැඩ සිටි සෙයින් වැද්ද නොහෙම්යි කීය. නැවත බෝධිසත්වයන් විසින් ''ඇදුර එ රන් රුව සැක නැතිව හැරගෙන එවයි කියා යවන ලදුව ගොස් ගෙනා යේ ය. ඉක්බිති බෝධිසත්වයෝ මවාලා ගෙනා රන් රුව ගබෙහි ලා තමන් කළ රුව ආභරණ ආදීන් සරසා රථ යානාවෙක්හි තබා ''මෙබඳු රූප ශ්‍රී ඇති කෙනෙකු ලදින් නම් පාවා ගනිමි'' කියා රන් රුව මෑණියන් සමීපයට යවූහ. ඒ දක බිසව් සතුටුව අමාත්‍යයන් රැස් කරවා සගයෙනි ම පුතණුවෝ නම් මහ පිනැත්තාහ ශක්‍ර දේවේන්ද්‍රයන් විසින් දෙන ලද කෙනෙක එහෙයින් සුදුසු කුමාරිකා කෙනෙකුන් ලැබෙති.

(i) බෝධිසත්වයන් විවාහ යෝජනාවට අකමැති වීමට හා රන්රුව නිර්මාණය කිරීමට හේතුව කුමක්ද?

.................................................................................................................................................

(ලකුණු 04 යි)

(ii) කුස රජුගේ චරිතය පිළිබඳ ඉස්මතුවන ආකල්ප දෙකක් ඡේදය ඇසුරින් ලියන්න.

..........................................................................................................................................................

(ලකුණු 04 යි)

(iii) කුස ජාතක කතුවරයා නාට්‍යමය ආකාරයෙන් භාෂාව හසුරුවා ඇති ආකාරය ඡේදය ඇසුරින් පහදන්න.

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

(ලකුණු 06 යි)

(iv) මිනිස් සිත ක්‍රියාත්මක වන ආකාරය කුස චරිතය හා මැණියන්ගේ චරිතය ඇසුරින් කෙටියෙන් විස්තර කරන්න.

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

(ලකුණු 06 යි)

**නැතහොත්**

හිස නමා ගති ඈ

සිහින් රතැඟිලි පටලවා ගති

සතියකට පෙර ගෙනා වර

විළිබරය මගෙ රන්වන් මනාලිය

දූල්තිර අස්සෙන්

පෙනෙයි ඈ

ඔබ යනු මොබ එනු

පට පිළී ගෙන අබරණ පෙට්ටි ගෙන

ඇසෙයි නොපෙනෙන විටත්

සාලයෙන් කාමරයට

කාමරයෙන් සාලයට

යන පා හැඬ

මා වෙත එකක් ඈ

වුවමනාවක් කිසිත් නැතිවද

නොරැඳෙයි පලායෙයි

ගැ විලවුනෙහි,

නැත, රන්වන් සමෙහි

හෙළන සුස්මෙහි සුවඳය ස්

ඈ බඳ සුවඳ

දැනෙන්නේ මට විතරද?

පෙනෙයි ඈ

ඇසෙයි

දැනෙයි

මට ගේ හැම තැන

(i) ඇය කථකයා වෙත වුවමනාවකින් තොරව පැමිණීමටත් නොරැඳීමටත් හේතුව කුමක්ද?

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

(ලකුණු 04 යි)

(ii) කවියා යොදාගෙන ඇති කාව්‍යෝක්ති දෙකක් ලියන්න.

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

(ලකුණු 04 යි)

(iii) මනාලියක වීමේ නැවුම්බව ඉස්මතුකර පෙන්වීමට කවියා ගත් උත්සාහය කෙටියෙන් විස්තර කරන්න.

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

(ලකුණු 06 යි)

(iv) අත් දැකීම පාඨකයා වෙත යාමට කවියේ ආකෘතිය කෙතරම් ඉවහල් වී ද යන්න කවි පෙළ ඇසුරින් කෙටියෙන් පහදන්න.

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

(ලකුණු 06 යි)

## II පත්‍රය

**සැලකිය යුතුයි**

- පළමුවන ප්‍රශ්නයද 2, 3, 4, 5 ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න දෙකක් ද ඇතුළු ව ප්‍රශ්න **තුනකට** පිළිතුරු සපයන්න.

1. පහත දී ඇති පැදි පෙළ කියවා දී ඇති ප්‍රකාශ උපයෝගී කොට ගෙන රසාස්වාදයක් ලියන්න.

   පිළිතුරක වචන 200ක්වත් තිබිය යුතු ය.

වැහි වලා කුළ පෑ කළු යැ යි ඔබේ
    නො හෙබෙති යි කිසි ලෙස් නො සතොස් නො වන්
සිරුරු පැයෙනු ගත් සුදනෝ ලොවේ
    නො හඳුනත් උතුමන් ගුණයෙන් විනා

පැහැ - නැඟී අහසේ පැතිරී ගොසින්
    මහ ගිමන් සිඳුවා සත සිත් නොසින්
කුඹුරු - වැව් - පොකුණුත් පුරවා දියෙන්
    ලොවට දෙන්නා ඔබයි අහරත් පැනුත්

නද අසා ඔබ ගේ පැහැයත් බලා
    මොනරු පිල් විදහා රඟ දෙත් නදින්
අමුතුයෙන් පණවත් ඔබ ලත් සෙයින්
    තුරු ලියත් ලිය ලයි සැනසී දියෙන්

සුදු වලා කුළු බෝ මැ අහස් කුසේ

ඉහළ යෙයි ඔබ සැම පහත් වැ මැ යි

එ පුදුමෙක් ද? උසස් නැණවත් දනෝ

ගුණ බරින් නැමුණෝ' වි පවතිත් නිතින්

කටට ගැන්ම ද බෝ මැ අමාරු වූ

කර දියත් ඔබ ගත් කලැ සාගරයෙන්

මිහිරි වෙයි උතුමන් සහ වාසයෙන්

නිවටයෝ ද උසස් වෙති බෝ සෙයින්

ගුණ බලා ඔබ ගේ ලො සබා දහම්

ඔබැ' රැ අන් කිසිවෙක් නිසි නෑ කියා

විදුලියත් පැහැ පත් රන දම් සෙයින්

පළඳවන්නේ ඔබේ ගෙලෙ මැයි බලන්.

(අ) පැදි පෙළට පාදක වූ අත්දැකීම

(ආ) කවියාගේ අත් දැකීමට අදාළ අවස්ථාවල උචිතානුචිත බව

(ඉ) කවියෙන් ඉස්මතු වන මිනිස් ගුණාංග

(ඊ) කාව්‍ය තේමාවට යොදා ගත් භාෂාව

(උ) සමාජයට ලබා දෙන පණිවුඩය

(ලකුණු - 06 × 05 + 30යි)

2. ''සුභාෂිතය එදිනෙදා සමාජයේ ජීවත්වීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන පොදු ජන කාව්‍යයකි.'' නිදසුන් **තුනක්වත්** දක්වමින් පහදන්න. (ලකුණු 15 යි)

3. කුස ජාතක කථාවේ එන සීලවතී බිසව උදාර මෙන් ම උපායශීලී රාජමාතාවක් වේ. උදාහරණ **තුනක්වත්** දක්වමින් පහදන්න. (ලකුණු 15 යි)

4. ශ්‍රී ලාංකික ගැමි ජන සුවඳ සිත් ගන්නා අයුරින් නිරූපණය කිරීමට කතුවරයා ගත් උත්සාහය ''තුං මං හන්දිය'' නවකතාවේ චරිත **තුනක්වත්** ඇසුරින් විමසන්න. (ලකුණු 15 යි)

5. මිනිසාගේ අධම චර්යාවල කුහකත්වය හා සත්ත්ව ලෝකයේ යහපත් බැඳීම් ඇත්ගාලේ දරුපෙම පද්‍ය පන්තිය ඇසුරින් උදාහරණ **තුනක්වත්** දක්වමින් විමසන්න. (ලකුණු 15 යි)

## සිංහල සාහිත්‍ය රසාස්වාදය - 10 ශ්‍රේණිය
## පිළිතුරු

## I පත්‍රය

1. i. (අ) කුද / කිරිමවු / කුදූ
   (ආ) පබාවතී / පබාවතී කුමරිය
   ii. (අ) මල්ලීව / කථකයාට
   (ආ) සෙනෙහස / කරුණාව / දයාව / මෛත්‍රිය
   iii. (අ) ලොකු මාමා / අබිලිං සිඤ්ඤෝ
   iv. (අ) උතුම් වූ ස්ථිරසාර ගුණයෙන් යුක්ත වූ උතුමකුට මුළු මහත් සාගරය කුඩා දිය කඩිත්තකි. මහා මේරුව තුඹසකි.
   (ආ) කුඩා දිය වළෙන් / මහාමේරු පර්වතය
   v. (අ) නිර්ධනයන් / නිර්ධන පාන්තිකයන් / ශ්‍රමිකයන් / කම්කරුවන්
   (ආ) මිනිස් කම / මනුෂ්‍යත්වය / මානව දයාව

(ලකුණු 04 × 05 = 20 යි)

2. i. තමන් විරූපි බව තේරුම් ගැනීම, රන්රුව සමාන කුමරියක් නොවේ යැයි සිතීම
   ii. තමන් පිළිබඳ සැබෑ ස්වභාවය දකීම
   දෙමාපියන්ට ඇති ගෞරවය හා සෙනෙහස
   iii. සංවාදශීලීව කුතුහලය දනවන නාට්‍යමය අවස්ථා ගොඩ නැගෙන පරිදි අවස්ථා නිරූපණයට සුදුසු සරල භාෂාව යොදා ගැනීම උදාහරණ සහිතව දක්වා තිබිය යුතුය.
   iv. කුස රජු අධිරාජ්‍යයෙකු වුවද තබා පිළිබඳව නිහතමානීව සිතන ආකාරයෙන් උපායශීලි වන ආකාරයත් තම දරුවා කෙරෙහි. ප්‍රාර්ථනාවක් ඉටුකර ගැනීමට මවක් ලෙස ගන්නා උත්සාහයත් විස්තර කළ යුතුය.

නැතහොත්

   i. ඇ තුළ තිබූ ආශාව හා ආධුනික බව නිසා
   ii. සිහින් රතැගිලි පටලවාගති ඇ / හෙළන සුස්මෙහි සුවඳ දැනෙන්නේ මට විතරද? යනාදී යෙදුම්
   iii. ස්ත්‍රී ගති ලක්ෂණ / ආධුනිකබව / ලැජ්ජාශීලී බව / සෞන්දර්යාත්මක බව / ආශාව යනාදිය ඉස්මතු වන අවස්ථා කෙටියෙන් විස්තර කර තිබිය යුතුය.
   iv. නිදහස් පද්‍ය ආකෘත්‍යය / සරල කෙටි භාවාත්මක යෙදුම් / අවස්ථා නිරූපණයට සුදුසු අවස්ථා තෝරා ගැනීම වැනි කරුණු කෙටියෙන් දක්වා තිබිය යුතුය.

(ලකුණු 04 + 04 + 06 + 06 = 20 යි)

## II පත්‍රය

1. සමස්ත පිළිතුර නිදසුන් සහිත ව වචන 200ක පිළිතුරක් විය යුතු ය.

(ලකුණු 06 × 05 = 30 යි)

2, 3, 4, 5 ප්‍රශ්නවලින් **දෙකක්** සඳහා, නිදසුන් **තුනක්** සඳහා,

(ලකුණු 03 යි)

සමස්ත විස්තරයට

(ලකුණු 12 යි)

(ලකුණු 15 × 02 = 30 යි)